**ශීර්ෂය 272 – කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**--------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සකසා ගැනීමේ දි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපව පිළියෙල කර තිබුණි.

(ආ) මෙම වාර්තාවේ 1.6.1 ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් නිල නිවාස හා බදු දෙන ලද වත්කම් වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රිත් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සියලු වත්කම් ගිණුම්ගත කළ යුතු වීම. | තක්සේරුව සිදුකර නොමැති හෙයින් එම වටිනාකම ගිණුම්ගත කිරීමට නොහැකිව ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 02 කට වඩා කල් ඉකුත් වූ වටිනාකම රු.17,166,644 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වර්ෂ දෙකකට වඩා කල් ඉකුත් වූ තැන්පතු මු.රෙ.571 ප්‍රකාරව මේ වන විට නිරවුල් කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| **වෙනත්** | | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22 ව්‍යවස්ථාවේ විධිවිධාන | උතුරු සහ නැගෙනහිර පළාත් හැර, අනෙකුත් පළාත්වල රජයේ ආයතන විසින් පොදු වාර්තා තබා ගැනීම හා සියලු කටයුතු ඉටුකිරීම සඳහා සිංහල භාෂාව භාවිතා කළ යුතු වේ. එසේ වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගොවි | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22 ව්‍යවස්ථාව අනුව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත |

සංවිධාන, ග්‍රාම සංවර්ධන සමිති ඇතුළු ප්‍රජාමූල සංවිධාන සමඟ එළඹි කොන්ත්‍රාත් ගිවිසුම්වලදී එම ගිවිසුම්වලට අදාල ව්‍යාපෘති සඳහා ඇතුළත් කර ඇති ව්‍යාපෘති ඉංජිනේරු ඇස්තමේන්තු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සකස් කර තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවය හැරගොස් සිටින සේවකයින්ගේ ණය සඳහා වසර 02 - 18 කට වැඩි කාල පරිච්ජේදයක් ගත වී තිබුණද, නිරවුල් නොවූ එකතුව රු.564,300 ක් වූ ණය ශේෂ 05 ක් 2019 දෙසැම්බර් 31 දිනට තව දුරටත් නිරවුල් නොවී පැවතුණි. | කඩිනමින් ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක වැඩ තහනම් කර ඇති නිලධාරීන් 7දෙනෙකුගෙන් එකතුව රු.566,382 ක ණය ශේෂය 2019 දෙසැම්බර් 31 දින වන විටත් අය කරගෙන නොතිබුණි. මෙම ණය ශේෂය වසර 01 ත් 19 ත් අතර කාල පරාසයක පැවතුණි. | කඩිනමින් ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක මියගිය නිලධාරින් 03 දෙනෙකුට අදාල රු.326,945 ක ණය මුදල 2019 දෙසැම්බර් 31 දිනට අය නොවී, වසර 1 ත් 16 ත් අතර කාල පරාසයක පැවතුණි. | කඩිනමින් ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත. |

## 3.3 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හෙට්ටිපොල නල්ලූර් මහ වැවෙන් රොන්මඩ ඉවත් කිරීමට වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපදෙස් හා පෙන්නුම් කර ඇති පරිදි වැව් තාවුල්ලේ ඉහලම කෙළවරින් පස් ඉවත් කර තිබුණ අතර රොන්මඩ වැඩිපුර තැන්පත් වී ඇති වැකන්දට සමීප කොටස් හාරා නොතිබුණි. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2017 ජුනි 07 දිනැති අංක 9/2017 චක්‍රලේඛයේ උපදෙස් සැලකිල්ලට නොගෙන තාවුල්ලේ ඉහල කෙලවරින් ඇස්තමේන්තු අනුව මීටර් 1 ½ ක් පමණ ගැඹුරට මීටර් 35 x 35 පමණ ප්‍රදේශයක පස් ඉවත් කර තිබුණ අතර, අසාමාන්‍ය ලෙස ගැඹුරු වීම නිසා රැඳෙන ජලය බැසයාමට තාවුල්ලේ සිට වැව මැදින් ඇලක් කපා ඇති බව අනාවරණය විය. | වැව් ගැඹුරු කිරීමේදී ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 9/2017 චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළයුතු වීම. | වැව් බැම්මෙහි අබලන්වූ කොටස සඳහා පස් යෙදීමට වැව් තාවුල්ල ප්‍රදේශයේ පස් කපා ඇත. සොරොව්වෙහි පඩි මට්ටම සැලකිල්ලට ගෙන සමහර ස්ථාන වල පමණක් අඩි 04ක පමණ ගැඹුරකට කැනීම් සිදු කර, එම ස්ථාන වල ජලය රැඳී නොපවතින ලෙස භූමිය සකස්කර ඇත.<br><br>පරීක්ෂණ වලවල් ඒ අසලම ඇති එම පස්ම යොදා වසා දැමීමට උපදෙස් ලබා දී තිබූ නමුත්, ගොවි සංවිධාන විසින් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. නඩත්තු මුදල් ගෙවීමට ප්‍රථම එය ඉටුකරවා ගැනීමට හැකි බව ව්‍යාපෘති අධීක්ෂණය කල ප්‍රාදේශීය වාරි ඉංජිනේරු මහතා ප්‍රකාශකර ඇත. |
| (ආ) | වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව් 02 කට අදාලව වැවෙන් පස් කපා වැව් බැම්මට පස් ප්‍රවාහනය කර වැව් බැම්ම සකස් කිරීමේ වැඩ විෂයය සඳහා මිල අනුපාතය ඝන මීටරයකට රු.486 ක් වුවද, රු.1,428 ක් ලෙස සලකා ඇස්තමේන්තු සකස් කර තිබුණි. මේ හේතුවෙන් එකතුව රු.343,716 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | බයව ඉහළ වැව -<br>වැව්වල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරීන් සඳහා විශේෂ පුහුණුවක් නොමැත.<br>ඒ අනුව පස් කපා බැම්මට පස් පිරවීම සඳහා 1428 මිල ඒකකය ලබාගත් අතර එය මුල් අදියරේ ඇස්තමේන්තු සඳහා යොදාගතිමි. කෙසේ වෙතත් එම මුදල භාවිතා කිරීමෙන් විගණනයට ලක් වූ වැව් වලින් රජයට පාඩුවක් සිදු නොකොට ප්‍රජා දායකත්වයෙන් බැම්ම සකස් කිරීම හා අනෙකුත් ඉදිකිරීම් කටයුතු විශාල කොටසක් සිදු කොට ඇත.<br>එබවලපිටිය ගැටුලාව වැව -<br>රු.22,673 ක රජයට සිදුවූ පාඩුව මුදල අදාල කොන්ත්‍රාත් පාර්ශවයෙන් අයකර මේ වන විට රාජ්‍ය ආදායමට බැර කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාල කැටගල් අල්ලා ප්‍රතිසංස්කරණය කරන මාර්ග ව්‍යාපෘති 36 ක ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව සකසා නොතිබුණි. මේ හේතුවෙන් රු.4,706,487 කින් ඇස්තමේන්තු මුදල වැඩිවී තිබුණු අතර ඒ මත ගෙවීම් කිරීම මගින් රජයට පාඩු සිදුවී තිබුණි. | නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතුවේ. තවද, නිවැරදි නොවන ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම මගින් සිදුවී ඇති සම්පූර්ණ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතු ව | මහව -<br>වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සකස් කරනලද HSR පොතෙහි අයිතම අංක RSI -017 මෙම ඇස්තමේන්තු සකස් කිරීම සඳහා යොදා ගෙන ඇත. එහි කිසිදු ස්ථානයක 40N කැටගල් සඳහා මිළ ගණන් යන්න සඳහන් කර නොමැත. එසේම HSR පොතෙහි මිල විශ්ලේෂණයන් අප වෙත ලබාදී නොමැත.<br>වැඩිපුර ගෙවීම් වලට අදාළ මුදල් සඳහා අතරුඳවුම් මුදල හිලව් කරන අතර ඉතිරි මුදල් අදාළ සංවිධානය මගින් ඉදිරියේදී අය කර වාර්තා කරමි.<br>පඩුවස්නුවර (බටහිර) –<br>විගණනය මගින් පෙන්වා දීමෙන් පසු ගෙවීම් නොකරන ලද ව්‍යාපෘති 06 ක ඇස්තමේන්තු සංශෝධනය කර නිවැරදි රේටය අනුව ගෙවීම් කරන ලදී. ඉතිරි මාර්ග 07 සඳහා විගණනය සිදුවන අවස්ථාව වන විටත් ගෙවීම් සිදුකර තිබුණි. ඒ අනුව රු.1,053,123 කින් වැඩිපුර ගෙවීමක් සිදු වී ඇත. වැඩිපුර ගෙවා ඇති මුදලින් රු.770,756 ක් රැඳවුම් මුදලින් අඩුකර ගත් බව දන්වා සිටිමි.තවද රැඳවුම් මුදල ප්‍රමාණවත් නොවන ව්‍යාපෘති වල ඉතිරි මුදල වන රු.282,367 ක මුදල ලබාදෙන මෙන් කොන්ත්‍රාත් කාර සමිති ලිඛිතව දැනුවත් කල අතර ඒ සඳහා එකගතාවය ලබාදී ඇත. ගිරිබාව හා කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව පිළිතුරු සපයා නොමැත. |
| (ඈ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ඉදි කරන ලද මාර්ග ව්‍යාපෘති 24 ක ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදි ලෙස සකස් කර නොතිබුණි. මේ හේතුවෙන් රු.1,090,403 කින් ඇස්තමේන්තු අධි ගණනය වී තිබුණු අතර මෙම අධි ඇස්තමේන්තුගත මුදල ගෙවීම් කිරීම මඟින් රජයට පාඩු සිදුවී ඇත. | -එම- | ගල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් සකස් කරන ලද ඇස්තමේන්තු 19 කින් අධි ඇස්තමේන්තු වීම මත වැඩිපුර ගෙවා ඇති රු.568,873 ක මුදල ආපසු රජයට ගෙවීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය සභාව වෙත ලිඛිතව දැනුවත් කර ඇත. එම ව්‍යාපෘති අතරින් "120 හිද්දැව ග්‍රාම නිලධාරි වසමේ ලෝකුරුගම ප්‍රේමලතා මියගේ නිවසට යන මාර්ගය බොරළු අතුරා |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රතිසංස්කරණය කිරීම" ව්‍යාපෘතියෙන් අය විය යුතු මුදල අවසන් ගෙවීම් සිදු කිරීමේ දී අය කර ගැනීමට කටයුතු කරන බව වාර්තා කරමි. ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඇස්තමේන්තු සකස් කරන ලද ව්‍යාපෘති 05 කින් අධි ඇස්තමේන්තු වීම මත වැඩිපුර ගෙවා ඇති මුදල අදාළ ගිවිසුම් ගත සංවිධාන වලට ආපසු රජයට ගෙවන ලෙසට ලිඛිතව දන්වා ඇත. |
| (ඉ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව බොරළු දමා සකස් කර තිබූ මාර්ග ව්‍යාපෘති 09 ක ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව සකස් කර නොතිබුණි. මේ හේතුවෙන් රු.536,069 කින් ව්‍යාපෘති පිරිවැය අධි ඇස්තමේන්තු ගතවී තිබුණු අතර, මෙම අධි ඇස්තමේන්තු ගත මුදල ගෙවීම් රජයට පාඩු සිදුවී ඇත. | -එම- | මෙම ව්‍යාපෘති ගල්ගමුව ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියත්මක කරන ලද ව්‍යාපෘතින් වන අතර, ව්‍යාපෘති 09 න් ව්‍යාපෘති 06 ක් සඳහා වැඩිපුර ගෙවීම් සටහන් කර ඇති රු.267,640 මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇත. මෙම ව්‍යාපෘති අතරින් එක් ව්‍යාපෘතියක් සඳහා මේවන තෙක් ගෙවීම් කර නොමැති බවද සඳහන් කරමි.<br>එසේම ඉතිරි ව්‍යාපෘති 03 ක් සඳහා රු.146,605 ක මුදල අයකර ගැනිම සඳහා ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දී ඇති අතර, ගෙවීම සඳහා එකඟවී ඇති බව සඳහන් කරමි. |
| (ඊ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ මාර්ගවල බොරළු දමා ප්‍රතිසංස්කරණය කිරීමේදී බොරළු මෝටර් ග්‍රේඩරයෙන් අතුරා තැලීමේ වැඩ විෂයය සඳහා පළාත් HSR වල මිල සම්මත අනුපාතය ඝන මීටරයකට රු.193 ක (R1-123A) මුදල වෙනුවට රු.401 (R1-123) යොදාගෙන තිබුණි. මෙම හේතුවෙන් මාර්ග ව්‍යාපෘති 14 කට අදාලව රු.438,672 කින් ඇස්තමේන්තු පිරිවැය අධි ගණනය වී තිබුණි. එසේම මෙම මුදල් ගෙවීම් කිරීම මඟින් රජයට පාඩු සිදුවී ඇත. | -එම- | මෙම ව්‍යාපෘති 14 න් 09 ක් ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වන අතර, ඉතිරි ව්‍යාපෘති 06 න් 02 ක් සඳහා ගෙවීම් කිරීමේදී අඩුකර ගෙවීමට ඉදිරිපත් කර ඇත. අනෙක් ව්‍යාපෘති 04 සඳහා ආපසු අයකර ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| (උ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ප්‍රතිසංස්කරණය කරන වාරිමාර්ග ව්‍යාපෘති 05 ක ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදි ලෙස සකස් කර නොතිබුණි. මේ හේතුවෙන් රු.2,457,550 ක අධි | -එම- | විගණනය පෙන්වා දී ඇත්තේ බැකෝ යන්ත්‍රයකින් පස් කපා බැම්මට ප්‍රවාහනය කර කම්පන රෝලකින් තැලීමට ඝන මීටරයකට රු.486 ක රේටය භාවිතා කළ යුතු බවය. නමුත් අපගේ වැව් |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත වීමක් සිදුවීම මත රජයට පාඩුවක් සිදුවී ඇත. | | ප්‍රතිසංස්කරණය කිරීමේදී සිදුවූයේ පවතින බැමි පස් යොදා ප්‍රතිසංස්කරණය කිරීමයි. මේ සඳහා භාවිතා කලේ D4 ඩෝසර් යන්ත්‍රයයි. එමඟින් මට්ටම් අනුව කපා බැකෝ යන්ත්‍ර මඟින් ට්‍රැක්ටර්වලට පටවා බැම්මට යොදා නැවත ඩෝසර් මඟින් අතුරා ජලය යොදා නැවත ඩෝසර් මඟින් බැමි ආනතිය තැලීමට ලක් කිරීමය. තවද, රු.1,660 මිල ඒ සඳහා භාවිතා කළ අතර, වැව්වල පස් ඉවත් කර වැව ඇතුළත ගොඩ ගැසීමට තිබූ අවස්ථා කීපයකදී බැකෝ යන්ත්‍ර මඟින් කපන ලද පස් වැව් බැම්මට ප්‍රවාහනය කර බැකෝ යන්ත්‍ර මඟින් වැව් බැම්මේ සිට ආනතියට ඇතිරීම සිදුකර යන්ත්‍ර නොයොදා කාප වෝල් මඟින් මිනිස් ශ්‍රම දායකත්වයෙන් සිදුකළ අවස්ථා සඳහා ඝන මීටරයකට රු.580 ක් භාවිතා කර ඇත. එසේ වුවද මිල විශ්ලේෂණයක් නොමැති නිසාත් ලබාදී ඇති රේට්වලට අදාල වැඩ පියවරයන් හා යොදා ගන්නා යන්ත්‍රවල විස්තරයක් ප්‍රමාණවත් නොවන බැවින් ඒ ඒ වැඩ අයිතමය සඳහා ගැලපේයැයි හැඟී ගිය හා වැව් බැම්මේ දිග පළල හා පස් කැපීම, ප්‍රවාහනය හා දුර අනුව රේට් භාවිතා කර ඇත. |
| (ඌ) | රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ගම්පෙරළිය සංවර්ධන වැඩසටහනට අදාල මාර්ග ව්‍යාපෘති 05 කට අදාල ඉංජිනේරු ඇස්තමේන්තු පරීක්ෂා කිරීමේදී ඇස්තමේන්තු 04 කට අදාලව නියමිත වැඩ විෂයයට අදාලව සත්‍ය මිල අනුපාතයන් යොදාගෙන නොතිබුණි. මේ හේතුවෙන් එකතුව රු.468,132 කින් අධි ඇස්තමේන්තුගත වීමක් සිදුවීම මඟින් රජයට පාඩුවක් සිදුවී ඇත. | -එම- | ඇස්තමේන්තු 4 ක් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සකසා ඇත. එයින් 2019 වසරේ ගම්පෙරළිය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර අවසන් කරන ලද්දේ ව්‍යාපෘති 02 කි. ඉතිරි ව්‍යාපෘති 02 ක සංශෝධන කරන ලදී. ඒ අනුව අධි ඇස්තමේන්තු සකස් කර ඇතත් ගෙවීම් වාර්තාවෙන් ඒම මුදල අඩු කර නිවැරදි කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (එ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 20 කට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේ ප්‍රවාහන ගාස්තු සඳහා කිලෝමීටර් 10 කට අදාල දිස්ත්‍රික් මිල | -එම- | ගම්පෙරළිය 2019 වැඩසටහන මඟින් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 20 කට අදාලව ද්‍රව්‍ය සැපයීමේ ප්‍රවාහන ගාස්තු සඳහා |

| | | | |
|---|---|---|---|
| | නියම කිරීමේ කමිටු රේටය වූ රු.531 වෙනුවට නිවැරදි නොවන ලෙස රු.986 ක් යොදා ගණනය කර තිබුණි. මේ හේතුවෙන් ඝනමීටර් 651.81 ක් සඳහා රු.455 බැගින් රු.296,573 ක් රජයට පාඩුවන සේ අධි ඇස්තමේන්තු කර ඒ මත ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි. | | සිදුවී තිබූ අධි ඇස්තමේන්තු මත ගෙවීම්වලින් එක් ව්‍යාපෘතියක් සඳහා වූ මුදල අයකර ඇති අතර, ඉතිරි ව්‍යාපෘති සඳහා අය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| (ඒ) | දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුවේ මිල ගණන් පදනම් කර ගෙන බොරළු සපයා ගොනු කිරීමේ මිල අනුපාතයන් යොදා ගෙන ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. මේ හේතුවෙන් ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් ක්‍රියාත්මක කරන ලද මාර්ග ව්‍යාපෘති 377 ක ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදි නොවන ලෙස සකස් කර තිබුණි. ඒ මත රු.6,100,767 කින් ඇස්තමේන්තු මුදල වැඩිවී තිබුණු අතර එම මුදල ගෙවීම් කිරීම මගින් රජයට පාඩු සිදු වී තිබුණි. | -එම- | උඩුබද්දාව -<br>සියළුම ව්‍යාපෘති සඳහා රැඳවුම් මුදලින් අය කළයුතු මුදල් ප්‍රමාණය ගණනය කර අදාළ ස්වේච්ඡා සංවිධානවල එකඟතාවය මත අයකිරීමට ඉදිරි කටයුතු සිදු කරන බව දක්වා ඇත.<br>කුරුණෑගල -<br>රු.1,858 ක මුදලට බොරළු යෙදීම ගණනය කර ඉදිරිපත් කර තිබූ ගෙවීම් වාර්තාවල එම රේටය රු.1,232 ලෙස සංශෝධනය කර ව්‍යාපෘති 13 ක් සඳහා අධි ඇස්තමේන්තු කර තිබූ රු.263,962 ක මුදලක් අයකර ගෙන ඇත.<br>ව්‍යාපෘති 10 කට අදාල බිල්පත් අතැති බිල්පත් වශයෙන් පවතින අතර එමගින් රු.180,100 ක මුදලක් අඩුකර දැනටමත් වවුචර්පත් සංශෝධනය කර ඇති බව දක්වා ඇත.<br>මාස්පොත හා මල්ලවපිටිය -<br>විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි බොරළු මීටර් කියුබ් එකක් සඳහා රු.1,266 ක මුදල තුල බොරළු ගොනු කිරීම සඳහා වන ගාස්තු ඇතුලත් කර නොමැති බව දක්වා ඇත.<br>කුලියාපිටිය (බට) -<br>ව්‍යාපෘති 136 ක් සම්බන්ධයෙන් වැඩිපුර ඇස්තමේන්තු කර ඇති රු.1,034,549 ක මුදලින් රු.142,790 ක මුදලක් අතැති බිල් වශයෙන් පවතින අතර, එය එම මුදල ගෙවීමේදී අයකරන අතර, රු.891,759 ක මුදලක් අයකර ඇත. |
| (ඔ) | ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැදගෙදර ග්‍රාම නිලධාරී වසමේ හීන පාමුල වැව රු.1,261,000 ක | -එම- | මැදගෙදර ග්‍රාම නිලධාරි වසමෙහි හීනපාමුල වැව ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තු සකස්කිරීම , |

| | | | |
|---|---|---|---|
| | මුදලකට ප්‍රතිසංස්කරණය සඳහා ඉහළ පැරකුම් ගොවි සංවිධානයත් සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. වැඩ විෂයය 1.1 වාන සහ සොරව්ව සෑදීම සඳහා වැව් බැම්ම කැපීම බැකෝ යන්ත්‍ර මඟින් සිදුකර ඒ සඳහා මිනිස් ශ්‍රමය යෙදවීමට අදාල ඝන මීටරයකට රු.1,615 බැගින් වූ රේටය පදනම් කර රු.80,750 ක් ගෙවා ඇත. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 වර්ෂයට අදාල වාරිමාර්ග මිල සම්මත අනුපාතයන්ට අනුව පස් ඝන මීටරයක් කැපීමට අනුමත මිල රු.109කි. මෙම අනුපාතය භාවිතා කරන ලද්දේ නම් වියදම රු.5,450 ක් බැවින් රජයට රු.75,300 ක ඉතිරියක් සිදුවන බව නිරීක්ෂණය කෙරේ. තවද, වැඩ විෂයය 1.5 අනුව වැව් බැම්ම සකස් කිරීම සඳහා ඝණ මීටර් 58.85 ක් බැහැරින් ගෙනා බව දක්වා රු.595 බැගින් රු.35,015 ක් ගෙවා තිබුණද, යොදාගත් පස් බැහැරින් නොව වැවෙන්ම ලබාගත් බව නිරීක්ෂණය විය.<br>වැවේ පස් ඉවත් කිරීමේදී නිවැරදි නොවන රේට භාවිතා කිරීම හේතුවෙන් රු.431,165 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය. | | අධීක්ෂණය ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු විසින් සකස් කරන ලදි. ඒ අනුව මෙම ඇස්තමේන්තු සකස්කිරීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2019 වර්ෂයට අදාල මිල ගණන් යොදාගෙන ඇති අතර, ඒ අනුව ගෙවීම් වාර්තාව සකස් කර ඇත.<br>විගණනයේ පෙන්වා දී ඇති පරිදි රු.431,165 ක මුදලක් අඩුවියයුතුව තිබුණි. එහෙත් සංශෝධිත ගෙවීම් වාර්තාව අනුව මුළු ගෙවීම් වටිනාකම රු.1,257,414 ක් සහ මුල් ගෙවීම් වාර්තාව අනුව ගෙවීම් වටිනාකම රු.268,827 ක් විය. ඒ අනුව සංශෝධිත ගෙවීම් වාර්තාව අනුව රු.11,412 කින් කළ වැඩ වටිනාකම අඩුවී ඇති බව කාරුණිකව දන්වමි. මු.රෙ. 237 ප්‍රකාරව ගිවිසුම්ගත වැඩ සම්බන්ධයෙන් විශේෂිත සහතික මත ගෙවීම් සිදුකිරීමේ හැකියාව ඇතත්, මේ වන තෙක් මෙම ව්‍යාපෘතියට අදාල ගෙවීම් සිදුකර නොමැති බවත් වැඩිදුරටත් වාර්තා කරමි. |
| (ඕ) | අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැව් 05 ක් ගැඹුරු කිරීම සඳහා පස් (රොන්මඩ) කපා වැව ඉස්මත්තේ ක්‍රමවත්ව ගොඩ ගැසීම සඳහා ඝන මීටරයට රු.169 ක් වූ පළාත් වාරිමාර්ග සම්මත අනුපාතය වන (ISR) 60:13 රේටය භාවිතා නොකර රු.383.30 ක් වූ අංක 60:16 රේටය භාවිතා කිරීමෙන් එකතුව ඝ.මී.4,735 ක් සඳහා රු.1,014,710 ක් වැඩිපුර ඇස්තමේන්තු කර තිබූ අතර, එයින් කර්මාන්ත 04 කට රු.768,265 ක් ගෙවා තිබුණි. | -එම- | ව්‍යාපෘති 04 ක පස් කපා ට්‍රැක්ටර් මගින් පස් ප්‍රවාහනය කර බැමෙන් අනතුරුව ඩෝසර් මගින් ගොනු කල බව දන්වා සිටිමු. ඝන මීටරයට රුපියල් 383.30 යන රේටය භාවිතා කර ඇත්තේ කාර්මික නිලධාරී විසින් වැවෙහි පෙන්වා දෙන ස්ථානවල පස් කපා පටවා ප්‍රවාහනය කර නැවත ජලය එන මාවත් අවහිර නොවන පරිදි බැමෙන් අනතුරුව ඩෝසර් යොදාගෙන මිනුමගත හැකි පරිදි ගොනු කර සැකසීම සඳහා වේ.ඔබ විසින් රුපියල් 169 ක් ලෙස ගෙන ඇත්තේ ඩෝසරය යොදාගෙන පස් තල්ලු කර ගොනු කිරිම සඳහා බව කාරුණිකව දන්වමි. ඒ අනුව මෙම වැව් හතරට අදාලව රජයට අලාභයක් සිදු වී නොමැති බව දන්වමි. නමුත් බොරවැව වසමේ දොඩම්ගොල්ලෑව වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී ට්‍රැක්ටර් |

| | | | |
|---|---|---|---|
| | | | මගින් ඇදීම හා ඩෝසරයෙන් තල්ලු කිරීම යන ක්‍රම දෙකම අනුගමනය කිරීමට සිදු විය. ඒ අනුව ඩෝසරය මගින් තල්ලු කල පස් ප්‍රමාණය සඳහා වැඩිපුර ගෙවා ඇති රුපියල් 81,932 ක මුදල අය කර විගණනයට වාර්තා කරමි. |
| (ක) | අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩදිවුල්වැව වසමේ පාසල අසලින් පිහිටා ඇති පන්සල ඉදිරිපිට මාර්ගය ප්‍රතිසංස්කරණයේදී ඇතිවූ විරෝධතාවයක් නිසා බෝක්කුවක් සහිත මීටර් 300x2.7 කොටසක් අවලංගු කිරීමෙන් සිදු වන ඉතිරිය වැලැක්වීම සඳහා අවශ්‍යතාවයක් නැතිව මීටර් 500 ක් දිග කොටසෙහි පළල මීටර් 0.9 කින් හා ඝනකම මී.0.075 කින් වැඩි කිරීමෙන් බොරළු ඝ.මීටර් 213.75 ක් අතුරා තැලීමට රු.396,284 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘතිය සඳහා බොරළු නාකොළගනේ විහාර භූමියෙන් ඝ.මීටර 212.25 ක්ද, මීටර් 500 ක් ඇතුළතින් ඝ.මීටර් 237.75 ක් අසල ඇති ඉඩමකින් ලබා ගෙන තිබුණි. බොරළු මිල කිරීමේ රේටය තුල කි.මී. 10 කට අදාල ප්‍රවාහන ගාස්තු ඇතුලත් කර තිබුණද සත්‍ය දුර ප්‍රමාණය අනුව ගෙවිය යුත්තේ කි.මී. 1 කට පමණක් බැවින් ඝ.මීටර 237.75 ක් සඳහා කි.මී. 09 ට රු.339.40 බැගින් රු.80,692 ක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම බොරළු ඝ.මීටර 450 නිසි ලෙස මිනුම් කර නැති බැවින් ගොනු කිරීම් හා මැනීම් සඳහා ඝ.මීටරයට රු.208 බැගින් රු.93,600 ක් වැඩිපුර ගෙවා ඇත. | -එම- | විගණනය විසින් කරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී මාර්ගය මනා ජල අපවහනයක් සිදුවිය හැකි මද බෑවුමකින් යුක්ත බවත් දැකගත හැකි බව ප්‍රකාශ කලද මාර්ගය සංවර්ධනය කිරීමට පෙර එවැනි තත්වයක් නොතිබූ බව සඳහන් කරමු. මාර්ගය මුල් ඇස්තමේන්තුවට වඩා ඝනකම වැඩිකරනු ලැබූයේ ඒහි දීර්ඝ කාලීන පැවැත්මට හා ප්‍රතිලාභීන්ට ගමනාගමන පහසුව සැලසීම සඳහාය. උඩදිවුල්වැව වසමේ පාසල අසල පන්සල ඉදිරිපිට මාර්ගය ප්‍රතිසංස්කරණයට අදාලව රු.62,075 ක මුදලක් අය කර ගැනීමට ගිවිසුම් ගත සංවිධානය දැනුවත් කර ඇති අතර එම මුදල අය කර ඉදිරියේ දී විගණනයට වාර්තා කරමි. |
| (ග) | බැහැරින් ලබා ගත් පස් ට්‍රැක්ටර් මගින් වැකන්දට දමා තැලීම් සඳහා පළාත් වාරිමාර්ග සම්මත අනුපාත අංක (ISR) 12 මගින් වැට් බදු රහිතව හා සහිතව පිළිවෙලින් ඝන මීටරයට රු.580 හා රු.595 රේට භාවිතා කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක වැව් 40 ක් සඳහා එකතුව පස් ඝ.මීටර් 20,194 ක් සඳහා භාවිතා කර ඇස්තමේන්තු සකසා තිබුණි. එසේ වුවද වැට් රහිත රු.580 ක රේටය ගණනය කිරීමේදී නිවැරදි රේටය රු.447 ක් වීම නිසා රු.2,426,429 ක් වැඩිපුර ඇස්තමේන්තු ගත වී තිබෙන බව නිරීක්ෂණය විය. | -එම- | කුලියාපිටිය (නැගෙනහිර) – වයඹ පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුපාත විශ්ලේෂණ කමිටුව විසින් 2019 වර්ෂයට අදාලව සකස් කරන ලද අනුපාතයන් යොදා ගනිමින් ඇස්තමේන්තු සකස් කර ඇති බව කාරුණිකව දන්වමි. රස්නායකපුර, උඩුබද්දාව, ඉබ්බාගමුව, බමුණාකොටුව, වීරඹුගෙදර, කොබෙයිගනේ, පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිතුර අනුව මෙම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් |

| | | | |
|---|---|---|---|
| | | | කිරීම හා අධීක්ෂණ කටයුතු කිරීම පළාත් වාරිමාර්ග කාර්යාලය මගින් සිදු කරනු ලැබූ අතර මෙම වැට් සහිත රේට භාවිතා කිරීම නිසා වැඩිපුර ගෙවීමක් සිදුකර ඇති අයිතම සහ එහි තොරතුරු ගණනය කිරීම් සහිතව පළාත් වාරිමාර්ග කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව සති 03 ක කාලයක් ඇතුලත සියළුම ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු සත්‍ය ඒකක මිල ගණන් ලබා දිය හැකි බවත් දන්වා ඇත. තවද මෙම වැඩිපුර ගෙවා ඇති මුදල් 10% රඳවුම් මුදල් සීමාව තුල හිලව් කර ගැනීමේ හැකියාව ඇති බවද, ඒ අනුව අදාල තොරතුරු ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය මගින් ලද වහාම වැඩිපුර ගෙවීම්කර ඇති මුදල අයකිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ච) | පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹගහමුල ඇලෙහි පස් ස.මීටර් 3,920 ක් කපා ඇලකන්ද සෑදීම සඳහා ස.මී.2,000 ට අඩු අවස්ථාවන්ට සීමා කල ස.මීටරයට රු.340 ක් බැගින් වූ පළාත් වාරිමාර්ග සම්මත අනුපාත අංක (ISR) 60.14 රේටය භාවිතා කර රු.176,400 ක වැට් බදු ඇතුළත්ව රු.1,332,800 ක් ගෙවීමට ඇස්තමේන්තු කර තිබුණි. මෙම කාර්ය සඳහා රු.175 ක්වූ පළාත් වාරිමාර්ග සම්මත අනුපාත අංක (ISR) 60.11 ක රේටය සුදුසු බව නිරීක්ෂණය කරන අතර එමගින් රු.646,800 කින් වියදම අඩු කර ගත හැකිව තිබුණි. | -එම- | ඩෝසර් යන්ත්‍ර භාවිතා කර ඇල බැම්මට පස් යෙදීම සිදුකරන ලදී. එම සාදා නිම කරන ලද සමහර කොටස් අතර මග දී පැවති අධික වර්ෂාව හේතුවෙන් පුරවන ලද පස් නැවත යටි බෑවුමට ගොස් නියමිත හැඩය වෙනස් වීමක් සිදු විය.ඩෝසර් යන්ත්‍රයක් භාවිතා කර එම පස් නැවත යෙදීමට නොහැකි වනසේ ජලය පිරී තිබීම හේතුවෙන් ඒ සඳහා බැකෝ යන්ත්‍රයක් ඉහල මට්ටමෙන් ස්ථානගත කර ක්‍රියාකරවීමට සිදුවිය. එම හේතුව නිසා අමතර බැකෝ පැය ගණනක් ගොවි සංවිධානයේ අරමුදලින් දැරීමට සිදුවූ බවත්, ඒ අනුව කිසිදු අක්‍රමික තාවයක් සිදු වී නොමැති බවත් ව්‍යාපෘතිය අධීක්ෂණය කළ ප්‍රාදේශීය වාරි ඉංජිනේරු මහතාගේ නිරීක්ෂණ වල දක්වා ඇත. |
| (ජ) | නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද කැටගල් අල්ලා මාර්ග සකස් කිරීමේ ව්‍යාපෘති 22 ක් සඳහා කැටගල් ප්‍රවාහන කිරීම වෙනුවෙන් කිලෝමීටර් 70 ක් ලෙස අසාමාන්‍ය අධික | -එම- | ගම්පෙරළිය වැඩසටහන සඳහා ඇස්තමේන්තු කිරීමේ දී නිවටන් 40 ප්‍රමාණයේ කැටගල් මෙම ප්‍රදේශයෙන් සොයාගැනීමට දුෂ්කරවීම නිසා පොලොන්නරුවෙන් සහ |

දුරක් සලකා කොන්ත්‍රාත්කරුට වාසිදායක ලෙස ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, බොහෝ ව්‍යාපෘති සඳහා මෙම කැටගල් ව්‍යාපෘති ස්ථානවල සිට කිලෝමීටර් 15-30 ත් අතර දුරකින් පිහිටි කොබෙයිගනේ ප්‍රදේශයෙන් මිලදී ගෙන තිබුණි. ඒ අනුව කැටගල් ලබාගෙන ඇති / ලබාගත හැකි ආසන්නම දුර සලකා ගෙවීම් කර නොතිබීම හේතුවෙන් යථෝක්ත ව්‍යාපෘති 22 ක් සඳහා කැටගල් ප්‍රවාහන සඳහා ගෙවන ලද මුළු ප්‍රවාහන වියදම වන රු.1,336,864 න් රු.907,158 ක් වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය.

කුරුණෑගලින් රැගෙන ඒම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලදී. මෙහිදී ගිවිසුම් ගත සංවිධාන මගින් කැටගල් සපයා ගැනීම සඳහා පොලොන්නරුව දක්වා ප්‍රවාහන වියදම් වශයෙන් ගෙවීම් කර ඇත්තේ ද කි.මී.70 ක උපරිම දුරක් සඳහා පමණි . අදාල කොන්ත්‍රාත් සංවිධාන විසින් දරන ලද වියදම් ඇස්තමේන්තු රේටයන් ඉක්මවා නොයන පරිදි ගෙවීම් සිදුකර ඇත.

(ට) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන යෝජනා ක්‍රමවලින් කැටගල් අල්ලා මාර්ග ප්‍රතිසංස්කරණය කර තිබූ ව්‍යාපෘති 11 පිළිබඳව කරනු ලැබූ විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) නිව්ටන් 25 කැටගල් මගින් ඉදි කර තිබූ ව්‍යාපෘති 04 ක් සඳහා නිව්ටන් 40 කැටගල් මගින් ඉදි කරනු ලබන මිල අනුපාතයන් යොදා ගෙන ගෙවීම් කර තිබුණි. මේ හේතුවෙන් රු.308,624 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.

-එම-

(i) මාර්ග ඉදිකිරීමේදී පලාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වර්ෂයට අදාල සම්මත මිල ගණන් සහිත නිකුත් කරන ලේඛනය (HSR) භාවිතා කර ඇස්තමේන්තු සකස් කරන අතර එහි කුට්ටිගල් ඇතිරීම සඳහා අයිතම අංක RSI – 017 යන වැඩ විෂයට අදාලව ඇස්තමේන්තු සකස් කරන අතර එම වැඩ විෂයෙහි විස්තරය භාවිතා කරනු ලබන කුට්ටිගල් වල නිව්ටන් ප්‍රමාණ සඳහන් කර නොමැත. නමුත් විගණනය මගින් පෙන්වා දීමෙන් පසු අදාල මිල විශ්ලේෂණ වාර්තා අදාල ආයතන මගින් ලබාගෙන විගණනයෙන් පෙන්වා දුන් මිල අනුව ඇස්තමේන්තු සැකසීම දැනට සිදුකරනු ලබයි.

එසේම විගණනය මගින් පෙන්වා දුන් ව්‍යාපෘතීන්වලින් අයකර ගත යුතු අධි ඇස්තමේන්තු මත ගෙවා ඇති මුදල් ප්‍රමාණය ඉතා කඩිනමින් අප වෙත ගෙවීමට කටයුතු කරන මෙන් ගිවිසුම්ගත සමිති මේ වන විට ලිපි මගින් දැනුවත් කර ඇත.

(ii) අමුණුකොලේ වැලියාගාර වැව අසල තුන්මංසල හන්දිය කුට්ටිගල් අල්ලා නවතා ඇති ස්ථානයේ සිට ඉදිරියට යන මාර්ග ව්‍යාපෘතියට අදාලව කැටගල් 11 ක සම්පිණ්ඩනතාවය පරීක්ෂා කර තිබුණු අතර එයින් කැටගල් 03 ක පැවතිය යුතු අවම නිව්ටන් ප්‍රමාණය නොතිබුණි. එය පරීක්ෂා කළ කැටගල් ප්‍රමාණයේ සියයට 27 ක ප්‍රමාණයකි. ඒ අනුව පරීක්ෂණය සමත්වීමේ සම්මත මට්ටම නොතිබූ මෙම ව්‍යාපෘතිය සඳහා

පරීක්ෂණ අසමත් ව්‍යාපෘතීන් සඳහා ගෙවීම් කිරීම පිළිබඳව වගකිව යුතු පාර්ශවයන් පිළිබඳව විධිමත් පියවර ගත යුතු වීම.

පරීක්ෂා කළ කැටගල් 11 න් කැටගල් 3 ක් සම්මත ප්‍රමාණයට වඩා අඩු සම්පිණ්ඩනතාවයක් පෙන්නුම් කල අතර එයින් එක් කැටගලක් සම්මත ප්‍රමාණයට දශම

| | | | |
|---|---|---|---|
| | රු.445,000 ගෙවා තිබුණි. | | එකක ප්‍රමාණයක් පමණක් අඩු වී තිබීමත්, දුරකථන මඟින් රසායනාගාරය විමසීමේදී ඉහත 24.9 ( N/ mm2 ) කැටගල සම්මත ප්‍රමාණයේ පවතීය යන නිගමනය මත එම කැටගල ද ඇතුළුව සමස්ථ පරීක්ෂණ ප්‍රතිඵල සියයට 80 වැඩි සමත්වීමේ ප්‍රතිශතයක් පෙන්නුම් කරන බැවින් මෙම වාර්තාව සාපේක්ෂ වශයෙන් කැටගල් සම්පිණ්ඩනතා පරීක්ෂණය සමත් ලෙස කටයුතු කලහැකි බවට උපදෙස් ලැබුණි. |
| (ඩ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක වැව් ගැඹුරු කිරීමට අදාල ඉවත් කරන ලද පස් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කළයුතු පස් ප්‍රමාණයට වඩා අඩුවෙන් වෙන්දේසි කිරීමෙන් වැව් 31 කින් රු.3,160,338 ක් පාඩුවක් රජයට සිදුවී තිබුණි. | ලිහිල් පස් ප්‍රමාණය නිවැරදිව ගණනය කළ යුතු වීම. | කොටවෙහෙර, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිළිතුරු ලෙස ගොඩගැසූ පස් දීර්ඝ කාලයක් පැවතීමත් එම කාලය තුළ අධික වර්ෂාවන්ට පවා ලක්වීම, සෑම පස් ගොඩක්ම වර්ෂාව හමුවේ සෝදායාම් වලට භාජනය වී තිබීම යනාදී හේතු ලෙස දක්වා තිබුණි. වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැව්පස්වල වටිනාකම අදාල බිල්පතෙන් අඩුකළ අතර, මේ වන තුරුත් මෙම වැව සඳහා අවසන් ගෙවීම් සිදුකර නොමැති බව දක්වා ඇත. ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිළිතුරු ලෙස පස් සම්බන්ධව විශේෂඥ දැනුමක් ඔවුන් සතුව නොමැති බව දැනුම් දී ඇත.<br>පඩුවස්නුවර (නැගෙනහිර), ඇහැටුවැව, කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පිළිතුරු ලබාදී නැත. |
| (ත) | එකතු කළ අගය බදු පනතට අනුව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා සේවා සඳහා ගෙවීම් කිරීමේදී වැට් බදු රහිත රේට භාවිතා කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක වැව් 59 ක එකතුව ස.මීටර් 87,582 ක් පස් කපා පටවා ප්‍රවාහනය කර ගොඩ ගැසීමේ | යන්ත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී වැට් මිල පදනම් කර නොගත යුතු වීම හා පළාත් සභා මිල කමිටුව තීරණය කර ඇති බැවිනුත් | පඩුවස්නුවර (බටහිර), කුලියාපිටිය (බටහිර), රස්නායකපුර, බිංගිරිය, කුලියාපිටිය (නැගෙනහිර), ඉබ්බාගමුව, වීරඹුගෙදර, උඩුබද්දාව ගොවි සංවිධාන ආදී ප්‍රජා සංවිධාන මගින් ඉටු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වලට වැට් සහිත රේට |

| | | | |
|---|---|---|---|
| | කාර්යය සඳහා ISR 60.16 හි සඳහන් ස.මීටරයට රු.392 ක රේටය වෙනුවට වැට් බදු සහිත රු.450 රේටය භාවිතා කර තිබුණි. මේ හේතුවෙන් ස.මීටරයට රු.58 බැගින් එකතුව රු.5,079,756 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවීමක් සිදු වීම මගින් රජයට පාඩු සිදු වනු ඇත. | කොන්ත්‍රාත්කරුවන් ගේ වැට් සඳහා ලියාපදිංචිය තහවුරු වී නොමැති බැවින් අදාල මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු වීම. | භාවිතා කිරීම සඳහා වයඹ පළාත් සභා මිළ කමිටුව මගින් ගන්නා ලද තීරණය පදනම් කරගනිමින් වැට් සහිත රේට භාවිතා කරමින් ඇස්තමේන්තු සකසා ඇත. මේ පිළිබඳව වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් විමසා ඇත. ඒ අනුව ඔවුන් විසින් ගණනය කර ලබා දෙන රේටයන් අනුව යම්කිසි මුදලක් අයකිරීමට ඇත්නම් අයකර වාර්තා කරන බව දැනුම් දී සිටිමි.<br>කොබෙයිගනේ -<br>මේ සම්බන්ධයෙන් අදාල කොන්ත්‍රාත්කාර ගොවි සංවිධාන දැනුවත් කර ඇත. එක් සමිතියක් පමණක් රුඳවුම් මුදලින් අයකර ගන්නා ලෙස හා ඉතිරියක් වේනම් ගෙවීමට එකඟ වී ඇත. |
| (ද) | ඉවත් කිරීමට ප්‍රමාණවත් රොන්මඩ ස්ථරයක් නොපැවති වාරියපොල ප්‍රා.ලේ. කොට්ඨාශයේ මැදගම තල්ගහමුල වැවෙන් රොන්මඩ ඉවත් කිරීමේ මුවාවෙන් වැලි කැට ගල් සහිත පස් ස.මීටර 6,000 කට වැඩි ප්‍රමාණයක් ඉවත් කර ඇති බව කාර්මික නිලධාරිගේ මැනුම් වාර්තා හා සටහන් මගින් තහවුරු කර ඇත. ඉවත් කළ පස්වලට මීටර් 500 ක් පමණ දුරින් ගොඩ ගසා සම්පූර්ණ පස් තොගයම ඉවත් කර ඇත. දිස්ත්‍රික්කයේ වැලි සහ කැට ගල් සහිත පස් කියුබ් 01 ක් රු.1,000 කට වැඩි මිලකට වෙන්දේසි වීම අනුව $\frac{6,000 \times 125 \times 1,000}{2.83 \times 100}$ ක් වශයෙන් රු.2,650,176 ක් වටිනා පස් තොගයක් ගොවි සංවිධානය විසින් ඉවත් කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | වැව් සම්බන්ධ කර්මාන්තවලදී වැවෙන් පස්, වැලි ඉවත් කිරීම මනාව අධීක්ෂණය කළ යුතු බව හා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් 2017 ජූනි 07 දිනැති 9/2017 චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු බව | මැදගම තල්ගහමුල වැවෙන් ඇස්තමේන්තු ප්‍රකාරව ඉවත් කරන ලද පස් ස.මී.6000 ප්‍රමාණය වැවෙන් ඉවත්කර ගෙන යාම හේතුවෙන් එම පස් ප්‍රමාණය කියුබ් 01 ට රු. 400.00 වටිනා කමකට අදාලව රු. 848,000 මුදලක් අදාල බිල්පතෙන් අඩු කර ඇත. |
| (න) | ගම්පෙරළිය 2019 වැඩසටහන යටතේ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැව් 5 ක වැව් බැම්මට අවශ්‍ය පස් වැවෙන් කපා වැව් බැම්මට පස් ප්‍රවාහනය කර වැව් බැම්ම සකස් කිරීම සඳහා ඝන මීටරයට වියදම පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සම්මත අනුපාතය අනුව රු.486 ක් වුවද රු.1,241 ක් ලෙස ගෙන තිබීම හේතුවෙන් රු.2,030,950 ක් වැඩිපුර ඇස්තමේන්තුගත වීමක් මත වැඩිපුර | නියමිත වැඩ විෂයයට අනුව නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතු වීම හා වැඩිපුර ගෙවීම් නැවත අය කළ යුතු වීම. | අප විසින් ගණනය කර ඉදිරිපත් කර කරන ලද වැඩිපුර ගෙවන ලද රු.635,031 ක මුදලින් දැනට ගෙවීම් කර ඇති ව්‍යාපෘති 03 කට අදාල එකතුව රුපියල් 235,131 ක් රුඳවුමෙන් අය කර ගත් බව දන්වමි.<br>නමුත් දැනට අක් මුදල් නොමැති නිසා ගෙවීම් කර නොමැති ව්‍යාපෘති 02 ක වැඩිපුර ගෙවීම්වලට අදාල රු. 399,899 ක මුදල ගෙවීම් |

| | | | |
|---|---|---|---|
| | ගෙවීමක් සිදුවී ඇත. | | කිරීමෙන් පසු අය කර විගණනයට වාර්තා කරන බව දන්වමි. |
| (ප) | ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව සියඹලාගස්වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී වැව් බැම්මට පස් ඝන මීටර් 601 ක් පිටතින් ගෙනවිත් දැමීම සඳහා රු.580 බැගින් රු.348,580 ක් ගෙවීම් කර තිබුණද වැව් බැම්මට දමා තිබු පස් ඇතුළතින් කපා තිබෙන බව අනාවරණය විය. | නියමිත වැඩ විෂයයට අනුව නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතු වීම. | මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී පස් කපා වැව් බැම්ම මත දමා සකස් කිරීම සඳහා මිල පළාත් වාරිමාර්ග මිල ගණන්වලට අනුව අධ්‍යයනයෙන් පසුව ඒ වන විට පැවති තත්වය අනුව රු.580.00 මිල යොදා ගෙන ඇත. මෙම වැඩ විෂය විගණනය කිරීමෙන් අනතුරුව ලද තොරතුරු මත මෙහි මිල විශ්ලේෂණය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ලබාගෙන ඇති අතර එහිදී මිල ගණන්වල වෙනසක් පැවති බව දැන ගැනීමට හැකිවී තිබේ. එම නිසා මින් ඉදිරියට සිදු කරන සියලු වැව් කර්මාන්ත සඳහා මිල විශ්ලේෂණයන් භාවිත කර සුදුසු රේටයන් යොදා ඇස්තමේන්තු සකස් කරන බවට කාර්මික නිලධාරි විසින් සඳහන් කර ඇත. |
| (බ) | මාර්ගයන්හි ඇතිරීමට පෙර සපයා ඇති බොරළු ගොනු කර මැනිය යුතු වුවත්, අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති 13 ක, එකතුව ගොනු 1277 න් නියැදියක් ලෙස එක් එක් ව්‍යාපෘතියෙන් සියයට 2 සිට සියයට 50 ක ගොනු 108 ක මැන ඝ.මීටර් 4,710.33 ක් සැපයූ බව ගණනය කර ඝ.මීටරයට රු.208 බැගින් ගොනු කිරීමේ වියදම ලෙස රු.979,748 ක් ගෙවා තිබුණි. මෙම බොරළු ධාරිතාවය කියුබ් 03 හා කියුබ් 01 ටිපර් රථ මගින් ප්‍රවාහනය කර අවශ්‍යතාවය අනුව මාර්ගයේ ස්ථාන ගත කර තිබුණද නැවත ගොනු සකස් කළ බව තහවුරු කිරීමේ සාක්ෂි නැති බැවින් ඉහත මුදල නොකළ යුතු වියදමක් බව නිරීක්ෂණය විය. | නිවැරදි ලෙස මිනුම් ගත යුතු වීම හා අය කිරීම් පිළිබඳ බැර විස්තර වාර්තා කළ යුතු වීම. | ගොණු කිරීම් සම්බන්ධව ව්‍යාපෘති 10 ක අයකර ගැනීම් රු.531,206 කි. ඒ අනුව වසම් 10කට අදාලව අය කිරීම් රැදවුමෙන් අය කර රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර ඇති අතර අය කර නොමැති ව්‍යාපෘති තුනට අදාල රු.159.695 ක මුදල් අය කර ඉදිරියේ දී විගණනයට වාර්තා කරමි. |

| | | | |
|---|---|---|---|
| (ම) | නියමිත වැඩවිෂයයට අනුව නියමිත මිල අනුපාතයන් භාවිතා නොකර ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කර තිබීම හේතුවෙන් මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාල අලුත්වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී රු.517,500 කින් අධි ඇස්තමේන්තු ගතවීමක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදි රේට යොදාගත යුතු වීම හා නියමිත වැඩ විෂයයට අනුව නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතු වීම. | වාරිමාර්ග කාර්යාලය ඉදිරිපත් කළ ගෙවීම් වාර්තාවට අනුව වැවේ රොන් මඩ ඉවත්කර වැව ගැඹුරු කිරීම සඳහා සන මීටරයකට රු.450 බැගින් සන මීටර් 2216 ක් සඳහා රු.997,200 ක වටිනාකමක් ඇතුලත් වී ඇත. එම මුදල මෙතෙක් ගෙවීම කර නොමැති අතර , විගණනය විසින් පෙන්වා දෙන රු.450 ක රේටයේ ඇතුලත් VAT වටිනාකම වන ඒකකයකට රු.58 බැගින් ඒකක 2216 ක් සඳහා රු.128,528 ක මුදලක් ද, පළමු කොටස් ගෙවීම් වවුචරයට අදාලව රු.14,370 ක මුදලක් ද වන පරිදි රු.142,898 ක මුදලක් ගෙවීම් වවුචරයෙන් අඩුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ය) | ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇතිනිමලේ පහලගම වැවේ බැම්මට පස් සන මීටර් 499.8ක් ප්‍රවාහනය කර සැපයූ බව සහතික කර තිබුණද, දැමූ පස් ප්‍රමාණය පිළිගත හැකි ආකාරයකට ගණනය කර නොතිබුණි. වැකන්දේ හරස්කඩ සටහන්, වැකන්දේ පළල හඳුනා නොගැනීම නිසා දැමූ පස් ප්‍රමාණය විධිමත්ව පිළිගත හැකි ආකාරයට ගණනය නොකිරීමෙන් ඇස්තමේන්තුගත සන මීටර් 428.40 ක් ඉක්මවා සන මීටර් 71.40 දැමූ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොවීය.<br>තවද, ඇස්තමේන්තුගත ප්‍රමාණයෙන් 2/3 ක් ඩෝසර් යන්ත්‍රයන් තල්ලු කිරීමක්ද, 1/3ක් ප්‍රවාහනය කිරීමක්ද සිදුකර ඇති බව නිරීක්ෂණය වීමෙන් ගෙවිය යුතු මුදල රු.149,083 ක් හා ගෙවූ මුදල 289,884ක් වීමෙන් රු.140,801ක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | වැව් බැම්මට දැමූ පස් ප්‍රමාණය සඳහා පිළි ගත හැකි සාක්ෂිත් ඉදිරිපත් කළ යුතු බව හා නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතුවේ. තවද, නිවැරදි නොවන ලෙස ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම මගින් සිදුවී ඇති සම්පූර්ණ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතු වීම. | මුල් ඇස්තමේන්තුවට අනුව වැව් බැම්මට දැමිය යුතු පස් ප්‍රමාණය 428.40 $m^3$ ලෙස ඇස්තමේන්තු කර ඇත.වැඩ විෂය ක්‍රියාත්මක කිරීමේ දී ලෙවල් උපකරණ ආධාරයෙන් මිණුම් ගැනීමේ දී 71.40 ක වැඩිපුර පස් ප්‍රමාණයක් බැම්මට යෙදීමට සිදු වූ බව අවසන් මිණුම් ගැනීමේ දී අනාවරණය විය. ඒ අනුව සංසන්දනාත්මක ඇස්තමේන්තුව මගින් එම තත්වය සංශෝධනය කර අනුමැතිය මත ගෙවීම් කර ඇත. ඒ අනුව වැඩිපුර ගෙවීමක් සිදු වී නොමැත. |

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා 2017, 2018 හා 2019 වර්ෂවල රු.35,568,218 ක ප්‍රතිපාදන ලබාදී ඇත. මෙම ව්‍යාපාරයේ අරමුණ 2020 වන විට ප්‍රජාපාලිත හා නිෂ්පාදන සේවා අභිමුඛ ග්‍රාම නිලධාරී වසම් 5000 ක් ඇති කිරීම තුළින් එකී ග්‍රාම ශක්ති තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමයි. ඒ සඳහා ජනතාවගේ මාසික ආදායම දෙගුණ කිරීම මෙම වැඩසටහනේ අරමුණක් වුවද, එය ඉටුවී නොතිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාම ශක්ති සමිති 360 ක් වෙත ලබාදුන් මුදලින් බැංකු ගිණුම් තුළ 2019 දෙසැම්බර් 30 දින වන විට රු.169,669,778 ක් නිෂ්කාර්යව පැවතුණි. | රජයේ මුදල් හැකිතාක් අදාල වැඩසටහනේ අරමුණ කරා ළඟා විය හැකි පරිදි වැය කළ යුතු බව | වසර 2030 වන විට ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතාවය තුරන්කර දුගීකම හා බැඳුණු එම සමාජ ආර්ථික ගැටළු සඳහා තිරසාර විසඳුම් ලබාදීමේ පරමාර්ථයෙන් යුක්තව අරඹා ඇත.<br>පළමු අදියර යටතේ සීමා සහිත ග්‍රාම ශක්ති ජනතා සමිති 90 ක් පිහිටුවා එම සමිති ලියාපදිංචිය සඳහා සමාගම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වෙත යොමු කර ඇත.<br>ලියාපදිංචි සමිති සඳහා ග්‍රාමශක්ති අරමුදලේ පළමු වාරික මුදල හා දෙවන වාරික මුදල් ලබා දී ඇත.<br>2019.12.31 දින වන විට සමිති 90ක් සඳහා රු. 178,400,000.00 ක ප්‍රතිපාදන ලබා දී ඇත. මෙම සමිති අරමුදලේ ජීවනෝපාය සඳහා වෙන් කළ කොටස යොදාගනිමින් චක්‍රීය ණය වැඩසටහනක් පවත්වාගෙන යාමට උපදෙස් ලැබී ඇති අතර ඒ සඳහා ගිණුම් තැබීමේ ක්‍රමවේදයක් ද හඳුන්වා දී ඇත. යටිතල පහසුකම් සඳහා වෙන් කළ මුදල් භාවිතා කරමින් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ග්‍රාමීය ජනතාවගේ අවශ්‍යතාව අනුව ධාරිතා සංවර්ධනයට වෙන් කළ මුදල් යොදාගනිමින් පුහුණු වැඩසටහන් ද පවත්වනු ලබයි. එමෙන්ම ග්‍රාමශක්ති වැඩසටහනේ දෙවන අදියර යටතේ සමිති 221 ක් සඳහා එක් සමිතියකට රු.400,000.00 බැගින් ලබා දී ඇති අතර ඊට අදාළ කටයුතු ද මේ වන විට සිදු කරමින් පවතී.<br>මෙම වැඩසටහන ග්‍රාමීය ජනතාව සමඟ ඉතා සමීපව කටයුතු කරමින් ඔවුන්ගේ ජීවන මට්ටම ක්‍රමානුකූලව ඉහළ නැංවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී යම් පසු බෑමක් ඇති වුව ද මේ වන විට රු.42,810,285 ක මුදලක් ව්‍යාපෘති සඳහා ණය වශයෙන් ලබා දී ඇත.<br>මෙම වැඩසටහන අංක 2153/12 හා 2019.12.10 දිනැති අතිවිශේෂ ගැසට් |

| | | |
|---|---|---|
| | | පත්‍රය මගින් ප්‍රජා සවිබල ගැන්වීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට යටත් කර ඇත. එම අමාත්‍යංශය යටතට පත්කිරීමෙන් අනතුරුව මෙම වැඩසටහන සම්බන්ධ උපදෙස් මෙතෙක් මා වෙත ලැබී නොමැති බව දන්වමි. කෙසේ වුවද මේ වන විට සමිති සඳහා බැරකර ඇති මුදල් භාවිතා කරමින් අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතින බව ද වැඩිදුරටත් දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර ඇති E-NIC ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක රු.2,592,590 ක් වටිනා ද්‍රව්‍ය, භාණ්ඩ හා කාර්යාල උපකරණද එම ව්‍යාපෘතිය සඳහා අනුයුක්ත කළ නිලධාරීන් 56 දෙනෙකුද නිෂ්කාර්යව පැවතුණි. | රජයේ මුදල් අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමව අදාල අරමුණ කෙරේ ළඟාවිය හැකි පරිදි වැය කළ යුතු වීම. | උක්ත ව්‍යාපෘතිය මෙතෙක් මෙකී කාර්යාල තුළ ආරම්භ කර නොමැති අතර එම ව්‍යාපෘතිය ආරම්භ නොකරන බව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිශ්චිතව දන්වා නොමැති බැවින් ඒ සඳහා ලබා දී ඇති ද්‍රව්‍ය ගබඩා කර තබා ඇත.ඒ අතරින් QR ස්ටිකරය භාවිතා කරන බව දන්වා ඇත. එම නිසා මේ වනතෙක් ඒවා නිශ්කාර්ය වත්කම් ලෙස නිශ්චිතවම හඳුනා ගත නොහැකි බව සඳහන් කර ඇත. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන් දෙදෙනා එකී කොට්ඨාශයන්හි හැඳුනුම්පත් සම්බන්ධ සියළු රාජකාරි කටයුතු සිදු කරන අතර ඌණ උපයෝජනයක් වී නොමැති බවත් සඳහන් කර ඇත. |
| (ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 21 කට අයත් රජයේ ගොඩනැගිලි 157 ක් හා රජයේ ඉඩම් අක්කර 245 ක් භාවිතයට නොගන නිෂ්කාර්යව පැවතුණි. | රජයේ වත්කම් උපරිම ඵලදායීතාවයෙන් භාවිතා කළ යුතු වීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිශ්කාර්යය වත්කම් පිළිබඳව විස්තර ඉදිරිපත් කර ඇත. |

**3.6** අනාර්ථික ගනුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ රස්නායකපුර, ගල්ගමුව, නිකවැරටිය, කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි කැටගල් අතුරා මාර්ග සකස්කිරීමේදී එක් එක් මාර්ගයේ ස්වභාවය, ගමන්ගන්නා වාහන වර්ග හා ප්‍රමාණය යන කරුණු අනුව යොදා ගතයුතු කැටගල් වර්ගය නිවිටන් ප්‍රමාණය අනුව තීරණය නොකර නිවිටන් 40 කැටගල් යොදාගෙන තිබුණි. | මාර්ගයේ ස්වභාවය හා ගමන් ගන්නා වාහන ප්‍රමාණය හා වර්ගය අනුව කැටගල්වල නිවිටන් ප්‍රමාණය තීරණය කළ යුතු වීම. | 2019 ගම්පෙරළිය වැඩසටහන යටතේ කැටගල් අල්ලා මාර්ග සකස් කිරීමේ දී ගමන් ගන්නා වාහන වර්ග හා ප්‍රමාණය යන කරුණු අනුව එම මාර්ගයන්හි දීර්ඝකාලීන අඛණ්ඩ පැවැත්ම යන කරුණු අරමුණු කොටගෙන නිවිටන් 40කැටගල් යොදා මාර්ග සකස් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) වැව් ප්‍රතිසංස්කරණයේදී කුඹුරු අක්කරයකට වියදම් කළ යුතු ප්‍රමාණය රු.25,000 ක් බව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව පිළිගෙන තිබුණද නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මල්ලිවැව හා ඉහල පව්වවැව ප්‍රතිසංස්කරණය සඳහා අක්කරයකට පිළිවෙලින් රු.142,857 ක් හා රු.200,000 ක් වැයකර තිබුණි. | චක්‍රලේඛවලට අනුගතව කටයුතු කළ යුතු වීම. | වැව් ප්‍රතිසංස්කරණයේදී ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී ගේ නිර්දේශය මත ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන සංවර්ධන කටයුතු සිදු කල අතර වැව යටතේ පවතින කුඹුරු අක්කර ප්‍රමාණයට අනුපාතව වියදම් කල යුතු මුදල් සීමාව පිලිබඳව සැලකීමක් නොවුණි. ඉදිරියේ දී සුළු වාරි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී එම කරුණු පිලිබඳව විශේෂ දැනුවත් වීමක් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |
| (ඇ) 2015 දෙසැම්බර් 30 දිනැති මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ 2016/1 ප්‍රකාරව ඉදිකරනු ලබන සියලු මාර්ග ජාතික මාර්ග පද්ධතිය හා සම්බන්ධ කළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, ජාතික ප්‍රතිපත්ති කටයුතු, නැවත පදිංචි කිරීමේ හා යටිතල පහසුකම් අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කළ ඇස්තමේන්තු වටිනාකම රු.1,200,000 ක් වූ මාර්ග ව්‍යාපෘති 02 කට අදාල ඉදිකිරීම් ජාතික මාර්ග පද්ධතිය හා සම්බන්ධ නොවන අයුරින් තැනින් | -එම- | මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සම්පූර්ණයෙන්ම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොලැබෙන බැවින් , මාර්ගයේ අත්‍යාවශ්‍යම ස්ථාන පමණක් සංවර්ධනය කිරීම සඳහා අනුමත මුදල් යොදවන ලදී. මාර්ග සංවර්ධන ව්‍යාපාති සඳහා මෙතෙක් ප්‍රතිපාදන වෙන් වි නොමැති බැවින්, මාර්ග පෙර තිබු තත්ත්වයෙන්ම පවතින අතර, නැවත ප්‍රතිපාදන වෙන්වූ පසු ජාතික මාර්ග පද්ධතිය හා සම්බන්ධ වන ලෙස මෙම මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු කරනු |

| | |
|---|---|
| තැන කොටස් ලෙස ඉදි කිරීම් කර තිබුණි. | ලැබේ. මේ පිළිබඳව අදාල පාර්ශවයන් දැනුවත් කිරිමට කටයුතු කර ඇත. |

**3.7 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන චක්‍රලේඛය ප්‍රකාරව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 විසින් ලියාපදිංචි ප්‍රජාමූල සංවිධාන 60 කට සෘජු ක්‍රමය යටතේ ප්‍රදානය කර තිබූ මිල එකතුව රු.93,827,150 ක් වූ කොන්ත්‍රාත් 72 ක්, එම චක්‍රලේඛයට පටහැනිව කළ වැඩ වටිනාකම සඳහා ලැබෙන මුදලින් සියයට 5 ක් තමන්ගේ සංවිධානයන්ට ලබා ගැනීමේ අරමුණෙන් උපකොන්ත්‍රාත් ලබා දී තිබුණි. | උපකොන්ත්‍රාත් ලබාදුන් ගොවි සංවිධාන අසාදුලේඛන ගත කළ යුතු වීම. | ගොවිජනසේවා ප්‍රාදේශීය නිලධාරී දැනුවත් කළ පසු ඊට පිළිතුරු වශයෙන් දක්වා ඇත්තේ එම සංවිධානවල අධීක්ෂණ කටයුතු වඩාත් විධිමත් අයුරින් ඉදිරියේදී පවත්වාගෙන යන බවයි. එසේ වුවද මෙම විගණන විමසුමෙන් පෙන්වාදෙන ලද කරුණු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව අනුමත ස්වේච්ඡා සංවිධාන මඟින් සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල කොන්ත්‍රාත් ඉටුකර ගැනීමේදී ගිවිසුම් ප්‍රකාරවම උප කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධකර ගැනීමකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තරයේ උපදෙස් දුන්බවත්, වසම්භාර සංවර්ධන නිලධාරින්ද ඒ සම්බන්ධයෙන් දැනුවත් කල බවත් කාරුණිකව සඳහන් කරමි. |
| (ආ) 2019 ගම්පෙරළිය වැඩසටහන යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැද ගෙදර වසමේ රු.2,000,000 ක ප්‍රතිපාදනයෙන් ඉදිකළ අත්පන්දු ක්‍රිඩාංගනයේ ආරක්ෂක වැට ඉදිකිරීම සඳහා යොදාගන්නා ඇතුළත විශ්කම්භය මි.මී.50 ගැල්වනයිස් බට සිරස්ව හා මි.මී.40 ගැල්වනයිස් බට තිරස්ව සවිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණි. සවිකළ බටවල විශ්කම්භය 2019 BSR රේට අනුව මි.මී.50 බටයක තිබිය යුතු විශ්කම්භයයට වඩා මි.මී.8.7 කින් අඩු වී තිබූ අතර හරස් අතට සවිකරන ලද මි.මී.40 ගැල්වනයිස් බටවල පිටින් පිට විශ්කම්භය මි.මී.5.7 කින් අඩුවී තිබූ නිසා ශක්තිය ඉතා දුර්වල විය. තවද මෙම බටවල මල නිවාරණ ආලේප කර ඇති බව තහවුරු නොවූ අතර කණු සවිකළ පදනමේ ස්ථාන 09 ක් සෑම පැත්තකින්ම | නිවැරදි නොවන මිනුම් වාර්තා ඉදිරිපත් කළ පාර්ශව සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම හා සංශෝධනය කිරීම්ද නිවැරදිව සිදුකර නොමැති බැවින් වැඩිපුර ගෙවූ මුදල නැවත ගණනය කර ආපසු අයකළ යුතු වීම. | ව්‍යාපෘතිය සිදුකිරීමේදී ඇස්තමේන්තුවේ සඳහන් විශ්කම්භය සහිත බට වෙනුවට පිටින් පිට විශ්කම්භය 48.5 MM සහ 42.5 MM සහිත ගැල්වනයිස් බට යොදාගෙන තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා යොදා ඇති පයිප්පවලට අදාල BSR රේට යොදා ගෙවීම් වාර්තාව සංශෝධනය කොට ගෙවීම් සිදුකර ඇත. අත්තිවාරම උස අඩි 2 ½ ක් සහ පළල අඩි 2 ½ කින් යුක්ත වන බැවින් සවිශක්තිය සම්බන්ධයෙන් ගැටළු සහිත තත්ත්වයක් ඇති වී නොමැති බව කාරුණිකව දන්වමි.<br>තවද මෙම බටවල මල නිවාරණ ආලේප කර ඇත. අත්තිවාරමෙහි ස්ථාන කිහිපයක ඉඩමෙහි පවතින ස්වාභාවික පැලීම් මගින් හුළං ඉරි වශයෙන් පැලීම් සිදුවී ඇතත්, 2020.08.18 දින සිදුකළ ක්ෂේත්‍ර |

| | | | |
|---|---|---|---|
| | පුපුරා ගොස් ඇත. | | පරික්ෂණ අවස්ථාව වන විටද මෙම පැලීම් වල වර්ධනයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය වූ බව කාරුණිකව දන්වමි. |
| (ඇ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,455,000 ක ප්‍රතිපාදන මත ප්‍රතිසංස්කරණය කරන ලද මයිලවැටිය වැව සඳහා ගෙවීම් කිරීමේදී වැඩ විෂයය අංක 1.1, 4.4 හා 4.5 සඳහා බැකෝ යන්ත්‍රයක් හා ඩෝසර් යොදාගෙන සිදුකර තිබුණද, ගෙවීම් කිරීමේදී මිනිස් ශ්‍රමය යෙදවීම සඳහා කරනු ලබන රේටයන් යොදා ගෙන තිබුණි. මේ හේතුවෙන් සොරොව්වට දැමීම සඳහා කඩකැපීම, ගැටි කාණු කැපීම හා වැකන්දට පස් දමා සකස් කිරීම සඳහා එකතුව රු.572,172 ක් වැඩිපුර ගෙවා තිබුණි. | -එම- | මෙම වැඩ විෂයේ 1.1 අනුව සොරොව් නල එලීම සඳහා මිනිස් ශ්‍රමය යොදා ගැනීම වෙනුවට යන්ත්‍ර යොදා ගැනිම හේතුවෙන් වැඩිපුර ගෙවා ඇති රු.21,837.00 ක මුදල සහ වැඩ විෂය 4.4 යටතේ වැව් බැම් මේ ආනතිය වැඩිකර ගැනීම සඳහා (බෙන්චින්) කැපීම සිදුකරන ලද්දේ මිනිස් ශ්‍රමය උපයෝගී කරගෙන බව කාරුණිකව දන්වමි. ඒහි සඳහන් රේටය යොදාගනු ලැබුවේ දිස්ත්‍රික් ඉංජිනේරු අනුමත කරන ලද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු මිල ගණන් අනුවය. වැඩ විෂයේ 4.5 අනුව පිටතින් පස් ගෙනැවිත් බැම්ම සකස් කිරීම වෙනුවට වැව ගැඹුරු කිරීම තුළින් ලබා ගන්නා පස් යොදා වැව් බැම්ම සකස් කළ බවට විගණනය මඟින් දන්වා තිබූ කරුණුවලට අනුකූලව වැඩිපුර ගෙවා ඇති රු.441,750 ක මුදලද රජයට ආපසු ගෙවන මෙන් ගොවි සංවිධානයේ සභාපති වෙත දැනුම් දී ඇත. |
| (ඈ) | අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයට අයත් ඕතර තිරුවම්පොල වසමේ බොරළු කැණීම් කළ ස්ථාන 17 ක් සම්බන්ධයෙන් සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් නිකුත් කරන කැණීම් බලපත්‍ර කොන්දේසි අනුව කැණීම් භූමිය මතුපිට ඇති පස් ස්ථරය කැණීම් කර පසෙකින් ගොඩගසා ගබඩා කළ යුතු අතර, කැණීම් කිරීමෙන් පසු එම පස් පුනරුත්ථාපන කටයුතු සඳහා යොදාගත යුතු නමුත්, බොරළු කැණීම් කළ ඉඩම් අයිතිකරුවන් මතුපිට පස් ස්ථරය ඉවත් කර කැණීම් කර නොතිබුණි. | පරිසර හානි අවම වෙන ලෙසද කටයුතු කළ යුතු වීම හා ඊට වගකිව යුතු ආයතන දැනුවත් කිරීමට නිරන්තරයෙන් හා අවශ්‍ය පියවර ගැනීම කළ යුතු වීම. | ඕතර කිරුවම්පොල වසමේ බොරළු කැපීම් ස්ථාන 17 සම්බන්ධයෙන් විගණන පරීක්ෂාවේදී පෙන්වා දී ඇති කරුණු අනුව<br>1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මඟින් ඛනිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම, පතල් කැනීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළදාම් කිරීම හෝ ආනයනය කිරීම පිණිස බලපත්‍ර නිකුත් කිරීමේ බලතල භූ විද්‍යා සමීක්ෂණය හා පතල් කාර්යංශය සතු බැවින් මෙම කොට්ඨාශයේ අනවසර කැනීම් සිදුවී |

| | | |
| --- | --- | --- |
| | | ඇති ස්ථාන සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ අධ්‍යක්ෂ මෙන්ම පොලිස් ස්ථානාධිපති දැනුවත් කර ඇත.<br>ඕතර කිරුවම්පොල වසමේ බොරළු කැනීම් කළ ස්ථාන 17 කට අදාල පුද්ගලයින් 03 දෙනෙකු ඉඩම්වල අනවසර බොරළු කැනීම් පිළිබඳව ඔවුන්ගේ නම්, ස්ථාන සහිතවම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය දැනුවත් කර ඇත. සෙසු පුද්ගලයන්ගේ ඉඩම් වල බොරළු කැනීම පිළිබඳ ඔවුන්ගේ නමින් නමට දැනුවත් කිරීම් නොකලද , අදාල ග්‍රාම නිලධාරී වසම් වල අනවසර බොරළු කැනීම් පිළිබඳ අදාල ආයතන දැනුවත් කර ඇත. |
| (ii) කැණීම් භූමියේ එක් රැස්වන ජලය ඉවත් කිරිම සඳහා සුදුසු ජල වහන ක්‍රමයක් සකස් කර කැපී ආනතිය අංශක 45 ලෙස පවත්වාගෙන යා යුතු වුවද, එසේ කර නොතිබුණි. | -එම- | ii. කැණීම් බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය විසින් අධීක්ෂණය හා පසු විපරම් කළ යුතුය. එවැනි කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් නෛතික කටයුතු සිදු කිරීමේ බලතල භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය සතු වේ. |
| (iii) මෙම ඉඩමේ සියල්ලම රජය විසින් වගා කටයුතු හා නිවාස ඉදිකර ගැනීම සඳහා ලබාදුන් රජයේ ඉඩම් වන බැවින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දෙනු ලබන බලපත්‍රයෙහි දෙවන උප ලේඛනයේ 1 වන කොන්දේසිය යටතේ ඛනිජ කැණීම ඉවත් කිරීම සඳහා බලපත්‍ර ලාභියා හට අධිකාරියක් නොමැත. එසේ වුවද මෙම කොන්දේසි කඩකර පස් ඉවත් කර තිබුණි. | -එම- | iii. විගණන විමසුමෙන් පෙන්වා ඇති එම කැනීම් අනවසරයෙන් සිදුවී ඇති කැනීම් වන අතර අනවසර කැනීම් සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර ඇත. |
| (iv)මෙම බොරළු කැණීම් කළ ස්ථාන 17ම භූ විද්‍යා හා පතල් කාර්යාශයේ ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් නිකුත් කළ බලපත්‍ර ලාභීන්ගේ ලැයිස්තුවේ සඳහන් නොවන අනවසර බොරළු කැණීම් කළ ස්ථානයන් වීම. | -එම- | -එම- |
| (v) විල්ගමුව වත්ත ග්‍රාම නිලධාරින් වසම් තුළ රජයේ ව්‍යාපෘති සඳහා සහ නිවාස අවශ්‍යතා සඳහා අසාමාන්‍ය ලෙස බොරළු කැපීම සිදුකිරිම හා | -එම- | |

| | | | |
|---|---|---|---|
| | අවස්ථා 04 ක් නායයාම් අවදානම් ඇති බව නිරීක්ෂණය විය. | | -එම- |
| (ඉ) | ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ පනාගමුව කිරිදිගල්ල පාරට තාර දැමීමේදී කොන්ත්‍රාත්කරුට වාසි සිදුවන ආකාරයට කාර්මික නිලධාරී විසින් මිනුම් කිරීමේදී වර්ග මීටර් 59.5 ක් පෙන්නුම් කර ඇති අතර සහකාර සැලසුම් අධ්‍යක්ෂ විසින්ද එය නිවැරදි බවට තහවුරු කිරීම හේතුවෙන් රු.74,868 ක් වැඩිපුර ගෙවීමට ඉදිරිපත් කර තිබුණි. | ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමේදී නිවැරදි මිනුම් අනුව ගෙවීම් කළ යුතු වීම හා අදාල පාර්ශව සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීම. | විගණනය විසින් පෙන්වාදුන් සියලු අඩුපාඩු සහ ප්‍රමාණයන් නිවැරදිකර සංශෝධිත ගෙවීම් වාර්තා සකස් කොට ගෙවීම් කටයුතු කරන ලද අතර, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසිදු අධිගෙවීමක් සිදුවී නොමැති බවත්, මෙම මාර්ගය වර්තමානය වන විටද භාවිතය සඳහා ඉතා යෝග්‍ය තත්ත්වයෙහි පවතී. |
| (ඊ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බුල්නෑව අහැටුගලයාය මාර්ග ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී නොකළ වැඩ සඳහා රු.174,443 ක් ගෙවා තිබුණි. | -එම- | රජයට අයවිය යුතු රු.174,443 ක මුදල ගෙවීම් කරන ලෙස ගිවිසුම්ගත සංවිධානය වෙත ලිඛිතව දැනුවත් කර ඇත. ගිවිසුම්ගත සංවිධාන විසින් ව්‍යාපෘතියේ රැඳවුම් මුදලින් එම මුදල පියවා ගන්නා ලෙස දැනුම් දී ඇති අතර, එම ප්‍රමාණය රැඳවුම් මුදලින් අඩු කිරීමට කටයුතු කරමි. |
| (උ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ ඉදි කරන ලද මාර්ග 15 කට අදාල කුට්ටිගල්වල සම්පින්ඩණතාවය (නිව්ටන් ප්‍රමාණය) පරික්ෂා කිරීමේදී මාර්ග 10 ක කුට්ටිගල්වල පැවතිය යුතු නියමිත සම්පිණ්ඩණතාවය නොතිබුණි. කුට්ටිගල්වල පැවතිය යුතු නියමිත ප්‍රමිතිය නොමැතිවීම හේතුවෙන් අදාල මාර්ගවල සාර්ථකත්වය කෙරෙහි අවදානම් තත්ත්වයක් පැවතිය හැකිය. | කැටගල්වල සම්පිණ්ඩණතාවය පෙර පරික්ෂා කිරීම පිළිබඳව සැක කටයුතුභාවයක් නිරීක්ෂණය වන බව හා මේ පිළිබඳව විධිමත් කමිටුවක් පත් කර විශේෂ පරික්ෂණයක් සිදු කිරීම සුදුසු වීම. | <u>ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u><br>මීගලෑව ඇලි මාර්ගය පොලිසිටිය හන්දියේ සිට ඇල පාමුල දක්වා කුට්ටිගල් ඇතිරීමේදී කුට්ටිගල් සම්පිණ්ඩණතාවය නිවුටන් 25 ලෙස සැලකීමේදී වැඩිපුර ගෙවීම් කර ඇති රු.246,513 ක මුදල රජය වෙත ආපසු ගෙවන ලෙස ගිවිසුම්ගත සංවිධානය දැනුවත් කර ඇත.<br>බණ්ඩාරගම වතුර ටැංකිය පාර කුට්ටිගල් අල්ලා ප්‍රතිසංස්කරණය කිරීමේ අවසන් බිල්පත් සැකසීමේදී රු.287,379 ක මුදලක් අඩුකොට වවුචර්පත් සකස් කර ඇත.<br>අලුත්හේරත්ගම වසමේ මාර්ගය කුට්ටිගල් අතුරා ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව අනුව එම මාර්ගය සඳහා නිවුටන් 25 ක්වූ සම්පිණ්ඩණතාවයට සකස් කර ඇත.<br><u>වාරියපොල, නිකවැරටිය,</u><br><u>කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාල</u> |

| | | | |
|---|---|---|---|
| | | | කාර්මික නිලධාරී විසින් කැටගල් ඇල්ලීමට පෙර අදාල මාර්ග දෙකෙහි තත්ත්ව වාර්තා ලබා ගෙන ඒවා සමත් වී ඇත. එසේම කැටගල්වල ස්වභාවය පරීක්ෂා කිරීමේදී එහි හැඩයේ, නිමාවේ, ප්‍රමිතියේ ගැටලුවක් නොතිබූ බැවින් මාර්ගයට කැටගල් ඇල්ලා ව්‍යාපෘතිය නිමා කිරීමට කටයුතු සිදු කරන ලදී. |
| (ඍ) | කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුට්ටිගල් අල්ලා සංවර්ධනය කරන ලද මාර්ග 02 ක කුට්ටිගල් අල්ලන ලද දෙපස කොන්ක්‍රීට් කර්බ් එක සඳහා භාවිතා කරන ලද හැඩයම් ලැල්ල උස ප්‍රමාණය වැඩියෙන් ගණනය කර රු.60,256 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | කැටගල්වල සම්පිණ්ඩණතාවය පෙර පරීක්ෂා කිරීම පිළිබඳව සැක කටයුතුභාවයක් නිරීක්ෂණය වීම හා මේ පිළිබඳව විධිමත් කමිටුවක් පත් කර විශේෂ පරීක්ෂණයක් සිදු කිරීම සුදුසු වීම. | ගැටි බැම් සඳහා හැඩයම් යෙදීමේදී කොන්ක්‍රීට් දැමීමට පෙර හැඩයම් මැනීම සිදුකරන ලදී. ඒම අවස්ථාවේදී නියමිත උස පැවතුණි. නමුත් ගැටි බැම්වල මට්ටම පවත්වා ගැනීමේදී යෙදූ හැඩයම්වලින් කොටසක් පමණක් කොන්ක්‍රීට් යෙදීමට සිදුවූ ඇත. ඒහි අඩුවන උස පස තුළට යොදා ඇත. |
| (එ) | කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තඹරොඹුව සිට අවුලේගම දක්වා මාර්ගය කැටගල් අල්ලා ප්‍රතිසංස්කරණය කිරිම මාර්ගයේ කර්බ් එක දෙපස ඇස්තමේන්තුවට අදාලව හැඩයම් ලැල්ලේ විය යුතු උස අඟල් 10 කි. නමුත් භෞතික පරීක්ෂාවේ දී තිබූ ලැල්ලේ උස අඟල් 08 කි. ඒ අනුව ලැල්ලේ පළල අඟල් 02 කින් අඩුවෙන් යොදා තිබුණි. එම නිසා එම වැඩ විෂය සඳහා ගෙවන ලද මුදල් රු.75,730X $\frac{2}{10}$ක් වශයෙන් රු.15,146 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ගෙවීම් කිරීමට පෙර නිවැරදි මිනුම් ලබාගැනීමෙන් පසු ගෙවීම් කළ යුතු වීම. | ගැටි බැම් සඳහා හැඩයම් යෙදීමේදී කොන්ක්‍රීට් දැමීමට පෙර හැඩයම් මැනීම සිදුකරන ලදී. ඒම අවස්ථාවේදී නියමිත උස පැවතුණි. නමුත් ගැටි බැම්වල මට්ටම පවත්වා ගැනීමේදී යෙදූ හැඩයම්වලින් කොටසක් පමණක් කොන්ක්‍රීට් යෙදීමට සිදුවූ ඇත. ඒහි අඩුවන උස පස තුළට යොදා ඇත. |
| (ඒ) | ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සකස් කර තිබූ ඉංජිනේරු ඇස්තමේන්තු පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.<br>(i) නිව්ටන් ප්‍රමාණය 25 ලෙස යොදාගෙන තිබුණද නිව්ටන් 40 යේ කැටගල්වලට අදාලව වර්ග මීටරයක සම්මත මිල අනුපාතය රු.2,266 ක වෙනුවට රු.2,939 ක් යොදගෙන තිබිම. | ගෙවීම් කිරීමට පෙර නිවැරදි මිනුම් ලබාගැනීමෙන් පසු ගෙවීම් කළ යුතු වීම. | (i) නිවුටන් 25 ලෙස අතපසුවීමකින් සටහන් වීම හේතුවෙන් එය නිවුටන් 40 ලෙස නිවැරදි කර ඇත .ඒ අනුව නිවුටන් 40 යේ කැටගල්වලට අදාලව වර්ග මීටරයක සම්මත මිල අනුපාතය වන රු.2,939ක් ලෙස සටහන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | (ii) ඇස්තමේන්තුවේ නිව්ටන් ප්‍රමාණය 25 ලෙස දක්වා පසුව එය 40 ලෙස කපා වෙනස් කර ගෙවීම් කර තිබීම. | | (ii) නිවුටන් 25 ලෙස අතපසුවීමකින් සඳහන් කර තිබූ අතර එය නිවුටන් 40ලෙස තාක්ෂණ සහකාර විසින් අත්සන් යොදා නිවැරදි කිරීමක් සිදු කරන ලද බව සඳහන් කරමි. |
| | (iii) ABC තට්ටුවේ ඝනකම ආසමාන්‍ය ලෙස වැඩිවන පරිදි ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කර තිබුණද, එවැනි ඝනකමක් අදාල මාර්ග 05 හි සත්‍ය වශයෙන්ම යොදා නොතිබිම. | | (iii) ABC තට්ටුවේ ඝනකම අඟල්8 ක් ලෙස සඳහන් කර ඇති අතර , මැනුම් ගැනීම ගොනු කිරීමෙන් අනතුරුව සිදු කරන බවත් කාර්මික නිලධාරි විසින් දක්වා ඇති පරිදි ඇස්තමේන්තු සකස් කිරීමේ දී සඳහන් කර ඇත්තේ ABC තට්ටුවේ සැහැල්ලු පරිමාව වන බවත් ඉදිකිරීම් අවසන් වන විට ABC තට්ටුව තැලීමට ලක් කිරීම නිසා එහි ඝනකම අඟල් - 5 6ත් අතර ප්‍රමාණයකට පැවතිය හැකි බව සඳහන් කරමි.<br>මෙම කරුණු අනුව ඇස්තමේන්තු සකස් කිරීමේ දී අක්‍රමිකතා සිදු කිරීමේ අරමුණින් ඇස්තමේන්තු සකස් කර නොමැති බව දන්වා ඇත. |
| (ඔ) | යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ 2018 වර්ෂයේදී ව්‍යාපෘති 34 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.62,922,034 ක ප්‍රතිපාදන මුදලක් අනුමත කර තිබුණි. මෙම මුදලින් වැව් 17 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.32,937,462 වෙන් කර තිබුණ අතර, එයින් ව්‍යාපෘති 05 ක් 2018 වර්ෂය තුළ සම්පූර්ණයෙන් ඉටු කර තිබුණි. එසේම ව්‍යාපෘති 04 ක් 2019 වර්ෂය සඳහා අවිච්ඡේද කර ක්‍රියාත්මක කර තිබුණු අතර ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඊට අමතරව 2019 වර්ෂයේද නැවත වැව් 07 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. 13,790,000 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුණි. එම ප්‍රතිසංස්කරණයන් ද සිදු කර තිබුණි.<br>i. යථෝක්ත වැඩසටහන යටතේ වැව් ප්‍රතිසංස්කරණයට අදාලව සිදු කර තිබූ වැව් 16 ක් සම්බන්ධයෙන් කරනු ලැබූ විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ. | නියමිත වැඩ විෂයයට අනුව නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතු වීම හා එසේම නිවැරදි නොවන ලෙස ඇස්තමේන්තු සකස් කිරීමෙන් සිදුවී ඇති සම්පූර්ණ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

- ඉංජිනේරු ඇස්තමේන්තු සදොස්ව සකස් කිරීමෙන් රු.9,863,754 ක්ද, නොකළ වැඩ සඳහා රු.3,576,953 ක්ද, වැඩිපුර ගෙවා තිබුණි.
- ගිවිසුමේ 17 වගන්තියට පටහැනිව අධිකාරී බලයන්ගෙන් තොරව සියලුම කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කළ ප්‍රජාමූල සංවිධාන විසින් උපකොන්ත්‍රාත් දී තිබුණි.
- වැලි නිස්සාරණය සඳහා උචිත පස් තිබූ වැව් 03 කින් ඝනමීටර් 8,562 ක් ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවා කපා තිබුණි.
- වැව් 06කට සොරොව් සම්පූර්ණයෙන් සවිකිරීම සඳහා ගෙවීම් කර තිබුණද, ඇතැම් වැඩ විෂයයන් හා උපාංග ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.
- අංක 9/2017 දරන ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රෙල්බ උපදෙස් උල්ලංඝනය කරමින් වැව් ගැඹුරු කර තිබුණ අතර, වැව් දෙකක වැව් බැම්මට දැඩි ලෙස හානි කර තිබුණි.
- රොන්මඩ ඉවත්කිරීම සඳහා ඩෝසර් යන්ත්‍ර පමණක් භාවිතා කළයුතු වුවත්, මෙම සියලුම වැව් ගැඹුරු කිරීම සඳහා බැකෝ යන්ත්‍ර භාවිතා කර තිබුණි.
- රු. ලක්ෂ 10 ට වැඩි ඇස්තමේන්තු 08 ක් දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද, තාක්ෂණික නිලධාරි සකස් කර තිබූ ව්‍යාපෘති ඇස්තමේන්තු ඊට ඉහල හෝ සමාන තනතුරක නිලධාරියෙකු විසින් පරික්ෂා කර නිවැරදි බවට අත්සන් කළ යුතු වුවද, තාක්ෂණික සහයක තනතුරේ නිලධාරියෙකු එම කාර්යය සිදු කර තිබුණි. එසේම ව්‍යාපෘති අධීක්ෂණය ඇතුළු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් දුර්වල මට්ටමක පැවතුණි.

| | | | |
|---|---|---|---|
| (ඕ) | ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැටගල් යොදා ඉදිකරන ලද මාර්ග 23 කට අදාලව නිව්ටන් 25 කොන්ක්‍රීට් කැටගල් යොදා මාර්ග සකස් කර තිබුණද, නිව්ටන් 40 කෝන්ක්‍රීට් කැටගල් යොදා මාර්ග සකස් කළ බවට ඇස්තමේන්තු සකස් කර තිබුණි. මෙම හේතුවෙන් මාර්ග 23 ට අදාලව එකතුව රු.3,032,568 කින් ඇස්තමේන්තු පිරිවැය අධි ගණනය වී ඇති අතර, මෙම මුදල ගෙවීම් කිරීම මඟින් රජයට පාඩු සිදුවී ඇත. | නියමිත වැඩ විෂයයට අනුව නිවැරදිව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතු වීම. ඒසේම නිවැරදි නොවන ලෙස ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමෙන් සිදුවී ඇති සම්පූර්ණ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගත යුතු වීම. | මෙම කොට්ඨාශයේ කැටගල් යොදා ඉදිකරන ලද මාර්ග 23 ක් සඳහා නිව්ටන් 25 කොන්ක්‍රීට් ගල් යොදා ඇති ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 05 ක් සඳහා ගෙවීම් කිරීමේදී නිව්ටන් 25 ට අදාල රේටය භාවිතා කර ගෙවීම් කර ඇත.<br>ව්‍යාපෘති 04 ක් සඳහා මේ වන තෙක් ගෙවීම් කර නොමැති අතර නිවව්ටන් 25ට අදාල රේටයන් අනුව බිල්පත් සංශෝධනය කර ගෙවීම් කිරීමට කටයුතු සකස් කර ඇත.<br>ඉතිරි ව්‍යාපෘති සඳහා වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවන ලෙස අදාල සංවිධාන වෙත දැනුම් දී ඇති බව සඳහන් කරමි. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු සකස් කිරීමට පෙර සෑම මාර්ගයක් ස්ථානීය පරික්ෂාවක් කර මාර්ගයේ පැවැත්ම හා බෝක්කු, තැලවිලි දැමීම වැනි අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු සකස් කළ යුතු වුවත්, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හදුනාගත් මාර්ග 03 ක් සකස් කිරීමේදී කාර්මික නිලධාරි ස්ථානීය පරික්ෂාවක් කර අවශ්‍යතාවයන් හදුනා නොගත් බව නිරීක්ෂණය විය. | ඇස්තෙමින්තු සකස් කිරීමට පෙර සෑම මාර්ගයක්ම ස්ථානීය පරීක්ෂාවක් සිදුකළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |
| (ආ) | ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇතිනිමලේ උණගස්වැව ප්‍රතිසංස්කරණ ඇස්තමේන්තුවට අදාලව ප්‍රමාණ පත්‍ර, හරස්කඩ (CS) ඩ්‍රෝවින් සටහන් සහිත සැලසුම් පිළියෙල කල බවට සාක්ෂි ඉදිරිපත් නොවිය. එසේම ලබාගත් මැනුම් පත්‍රයේ දක්වා ඇති වැකන්දේ උස හා පළල පිළිබඳව විගණනයේදී සෑහිමකට පත්විය නොහැකි වූ අතර ඇස්තමේන්තු ගත ප්‍රමාණය වූ ඝන මීටර් 113.4 ඉක්මවා ඝන මීටර් 1174ක් | ප්‍රමාණපත්‍ර හා හරස්කඩ **(CS)** අදාල ලිපිගොනුවට ඇතුළත් කළ යුතු බව හා ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ 2017 ජූනි 07 දිනැති අංක 9/2017 චක්‍රලේඛයේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වීම. | ඇතිණිමලේ උණගස් වැව ප්‍රතිසංස්කරණයට අදාළව ප්‍රමාණ පත්‍ර හා හරස්කඩ (CS) සටහන් සකස් කර කාර්මික නිලධාරි ගොනුවේ ගොනු කර ඇත. ඇස්තමේන්තුවේ අයිතම අංක 05 අනුව වැව් බැම්ම සකස් කිරීම සිදු කිරීමට සැලසුම් කරන ලදි. ඩොසර් යන්ත්‍ර හා ට්‍රැක්ටර් භාවිතා කර වැව් බැම්ම සකස් කරන ලදි. මෙහි දී ඩෝසර් යන්ත්‍රය යා නොහැකි ස්ථාන සඳහා ට්‍රැක්ටරය |

| | | |
|---|---|---|
| පස් දමා වැකන්ද නිමකර තිබුණි. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2017 ජුනි 07 දිනැති අංක 9/2017 චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව වැලි සහිත පස් ඉවත් කිරීම සඳහා කැනීම් සිදුකර ඇති බව ද නිරීක්ෂණය විය. | | භාවිතා කර ඇස්තමේන්තු ප්‍රකාරව පස් දමා සකස් කරන ලදි. මෙම වැවේ වැලි සහිත පස් තට්ටුවක් නොතිබූ අතර වැව් බැම්මට යෙදීමෙන් පසු ඉතිරි පස් 2019.08.30 දින රු. 158,820.00 කට වෙන්දේසි කර ඇත. එහෙත් තව දුරටත් එම පස් ඉවත් කර නොගෙන එම වැව් තාවුල්ලේ ගොඩ ගසා ඇත. එම වෙන්දේසි කරන ලද පස්, වැලි නිස්සාරණය සඳහා යොදා ගත්තේ නම් මෙතරම් කාලයක් වැව් තාවුල්ල තුළ ගොඩ ගසා නොතිබෙන බව පැහැදිලි කරන අතර, එබැවින් පස් ඉවත් කිරීම සඳහා කැනීම් නොකල බව තහවුරු කරමි |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම හා භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන අරමුණු ළඟා කර ගැනීමේදී ඒ සඳහා වූ ඉලක්කයන් වෙත ළඟාවීමේ ප්‍රතිශතය කාර්ය සාධන වාර්තාව අනුව සියයට 48.5 කට වඩා පහල මට්ටමක පැවතුණි. | තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | තිරසර සංවර්ධන අරමුණු 17ට අදාළ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට නියමිතව ඇත්තේ 2030 වර්ෂයේදීය.මෙම ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය සලකා බලනුයේ දැනට රටතුල පවතින තත්වය හා පාදක දත්තයන්ට අනුකූලව උචිත වූ දර්ශක යොදා ගනිමිනි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කරනු ලබන්නේ විවිධ රේඛීය අමාත්‍යාංශ විසින් වාර්ෂිකව හඳුන්වා දෙනු ලබන වැඩසටහන් වේ. එසේම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශ විසින් පෙර වර්ෂවල ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් පදනම් කර ගනිමින් ඊළඟ වර්ෂයේදී සැලසුම් සකස් කරනු ලබන අතර රේඛීය අමාත්‍යාංශය මඟින් ලැබෙන ප්‍රතිපාදන මත මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව තිරසර සංවර්ධන අරමුණ 5 යටතේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීමට අදාළව 2019 වර්ෂයේදී සැලසුම් කළ වැඩසටහන් සියල්ල සඳහා ප්‍රතිපාදන ලැබී |

| | | |
|---|---|---|
| | | නොමැති අතර ලැබුනු ප්‍රතිපාදන මත වැඩසටහන් ක්‍රියාත්මක කර අදාල ප්‍රගතිය ලබා ගෙන ඇති බව කාරුණිකව දැනුම් දෙමි. |

**5. යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙබ් අඩවි මහජන පැමිණිලි භාරගත හැකි ආකාරයෙන් සකස් කර නොතිබුණි. | වෙබ් අඩවි මහජන පැමිණිලි භාරගත හැකි ආකාරයට සකස් කළ යුතු වීම. | මෙම ගැටළුව විසඳීම සම්බන්ධයෙන් කිසිදු තාක්ෂණික සංස්කරණයක් සිදු වී නොමැති බවත් කාරුණිකව සඳහන් කරමි. |

**6. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2019 වර්ෂය අවසානය වන විට මුළු සේවක පුරප්පාඩු සංඛ්‍යාව 312 ක් වු අතර, ඉන් 18 ක් ප්‍රාථමික මට්ටමේද, 265 ක් ද්විතියික මට්ටමේද, 18 ක් තෘතීයික මට්ටමේද, 11 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේද විය. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කල යුතු වීම. | 2020.06.30 දිනට මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ඊට අනුබද්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පුරප්පාඩු 336ක් පවතින අතර, එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් හා ස්ථානමාරු ලබාදීම සිදු කරනු ලබනුයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගිනි. |
| (ආ) | භාෂා පරිවර්තක තනතුරු අනුමත නොවුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක භාෂා පරිවර්තක නිලධාරීන් 10කු සේවයේ යොදවා තිබුණි. | මෙම නිලධාරීන් ඵලදායී ලෙස සේවයේ යොදවා ගතහැකි කාර්යාල වෙත යොමුකල යුතු වීම. | පිළිතුරු ලබා දී නැත. |